# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/06 - 2022 දෙසැම්බර් මස 12 වැනි සඳුදා - 2022.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 21/78 (XV) (ඇ)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (කලින් කලට සංශෝධිත පරිදි වූ) 2006 ජූනි මස 9 වන දින අංක 1448/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, (2022 අප්‍රේල් මස 18 වන දින අංක 2276/04 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ශාස්ත්‍ර පීඨය" යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "12. තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"13. සන්නිවේදනය හා නිර්මාණාත්මක කලා අධ්‍යයන අංශය.".

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම),
අධ්‍යාපන අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0124

1A - PG 6090 — 457 (2022/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.